සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

9 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 | 40 S I,II

**පෙරදිග සංගීතය** | කාලය පැය දෙකයි

නම / විභාග අංකය : ..................................................................................................................

**සැලකිය යුතුයි :-** • ප්‍රශ්න අංක 01 සිට 20 දක්වා ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. ධ,ග ස්වර වාදි සංවාදි ලෙස යෙදෙන ශුද්ධ ස්වර පමණක් භාවිතා වන රාගය,
 i.කාෆි වේ. ii. භූපාලි වේ. iii. බිලාවල් වේ. iv. භෛරවි වේ.

02. කෝමල ස්වර දෙකක් භාවිතා වන රාගය හා ස්වර දෙකක් වර්ජිත වන රාගය ලෙස නම් කළ හැකි රාග යුගලය පිළිවෙලින්,
 I. කාෆි - බිලාවල් ය. ii. කාෆි - භූපාලි ය. iii. භූපාලි - කාෆි ය. iv. කාෆි - යමන් ය.

03. (a) ගමප, ගමරිස (b) ගපධප, ගරිස (c) සසරිරිගු, සරිප මෙම කෙටි ස්වර ඛණ්ඩ අයත් වන රාග පිළිවෙලින්,
 i. භූපාලි/ කාෆි / භෛරවී වේ. ii. කාෆි / භූපාලි / බිලාවල් වේ.
 iii. බිලාවල්/ භූපාලි/ කාෆි වේ. iv. කාෆි / බිලාවල්/ භූපාලි වේ.

04. ශුද්ධ නිෂාධය විවාදි ස්වරයක් ලෙස යොදා ගනු ලබන රාගය වන්නේ,
 i. භූපාලි ii. බිලාවල් iii. කාෆි iv. යමන්

05. ගායනය හෝ වාදනය සඳහා යොදා නොගන්නා, රාග උත්පාදනය සඳහා පමණක් විශේෂිත ස්වර සමූහය,
 I. මුඛ්‍යාංගය යි. ii. අලාපය යි. iii. මේලය යි. iv. සර්ගම් ගීතයි.

06. මිශ්‍ර මත්කැටි යෙදෙන හින්දුස්ථානි තාලයක් හා එයට සමාන දේශීය තිත් රූපය වන්නේ,
 i. දාදරා තාලය / මැදුම් තනිතිත. ii. ජප්තාලය / සුළු මැදුම් දෙතිත.
 iii. දීප්චන්දි තාලය / මහතනි තිත. iv. දාදරා තාලය / මැදුම් මහ දෙතිත.

07. රාගයක විස්තර ඇතුලත් කරමින් තාලාත්මක පබැඳුනු ගීත හැඳින්වෙනුයේ,
 i. සර්ගම් ගී නමිනි. ii. මධ්‍යලය ගී නමිනි.
 iii. ලක්ෂණ ගී නමිනි. iv. සරළ ගී නමිනි.

08. ස්වර පුවරුව දකුණතින් හා බේස් පුවරු වමතින් වාදනය කෙරෙන සුෂිර වාද්‍ය සණයේ සංගීත භාණ්ඩයක් වන්නේ,
 i. මෙලෝඩිකාව යි. ii. සර්පිනාව යි. iii. එකෝඩියනය යි. iv. ඕගනය යි.

09. ගසල් ගායනයේ ප්‍රධානතම ස්වර වාද්‍ය භාණ්ඩය ලෙස හැඳින්වේ.
 I. තබ්ලාව යි. ii. සර්පිනාව. iii. සිතාරය. iv. වයලීනය.

10. ''පධනිසරිගමප'' යන ස්වර වලින් හැඳින්වෙන ස්කේලය නම් කෙරෙනුයේ,
 i. F Major. ii. G. Major. iii. C Major. iv. D Major.

11. බටහිර සංගීත භාණ්ඩ වර්ගීකරණය ප්‍රධාන වශයෙන් කොටස්,
 i. දෙකකි. ii. තුනකි. iii. හතරකි. iv. හතකි.

12. බටහිර ස්වර ප්‍රස්තාරයක තාලය හඟවන සංකේතය හැඳින්වනුයේ,

i. Bass Clef. ii. time Signature. iii. Minim. iv. Rest.

13. විශාරද නන්දා මාලනී මහත්මිය ගයන ''රුක් අත්තන මල මුදුනේ'' ගීතයට පාදක කොට ගෙන ඇති වන්නම වනුයේ,

i. හනුමා වන්නමයි. ii. උකුසා වන්නමයි. iii. නෛයඩි වන්නමයි. iv. තුරඟා වන්නමයි.

14. ප්‍රශස්ති ගායනා සඳහා ආභාෂය කොට ගත් සංගීත සම්ප්‍රදාය වන්නේ,

i. අපරදිග සංගීතය යි. ii. කර්ණාටක සංගීතය යි.

iii. හින්දුස්ථානි සංගීතය යි. iv. ජන සංගීතය යි.

15. දේශීය නර්තන සම්ප්‍රදායන්ට අනුව දවුල ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය ලෙස යොදා ගනු ලබන නර්තන සම්ප්‍රදාය වන්නේ,

i. උඩරට සම්ප්‍රදාය වේ. ii. බටහිර සම්ප්‍රදාය වේ.

iii. පහතරට සම්ප්‍රදාය වේ. iv. සබරගමු සම්ප්‍රදාය වේ.

16. හින්දුස්ථානි සංගීතය ආභාෂ කොට ගෙන නිර්මාණය වී ඇති නාට්‍ය සම්ප්‍රදාය ලෙස සැලකෙනුයේ,

i. නාඩගම් නාට්‍ය ශෛලිය යි. ii. නූර්ති නාට්‍ය ශෛලිය යි.

iii. කෝලම් නාට්‍ය ශෛලිය යි. iv. නව නාට්‍ය ශෛලිය යි.

17. මහනුවර යුගයේ රජවාසලේ කවිකාර මඩුව කේන්ද්‍රකොට ගෙන බිහිවූ ගීත වර්ග දෙකක් ලෙස ගැනෙනුයේ,

i. ප්‍රශස්ති ගී / නූර්ති ගී වේ. ii. වන්නම් / ප්‍රශස්ති වේ.

iii. වන්නම් / බැති ගී වේ. iv. ප්‍රශස්ති / කෝලම් ගී වේ.

18. ''ඇත කඳුකර හිමව් අරණේ'' ගීතය ඇතුළත් නව නාට්‍ය වන්නේ,

i. කාලගෝල ii. නල දමයන්ති iii. හුණුවටය iv. කුවේණි

19. නොයෙල් බ්‍රයන් රණසිංහ මහතා දායක වී ව්‍යාප්ත කරන ලද, ශ්‍රී ලංකා ගුවන් විදුලිය ආශ්‍රිතව බිහිවුණු ගායන විශේෂයක් ලෙස හැඳින්වෙන්නේ,

i. කපිරිඤ්ඤා ගී. ii. කණ්ඩායම් ගී. iii. නාට්‍ය ගී. iv. සරළ ගී.

20. පිය සෙනෙහස හා මනා සම්බන්ධතාවයක් පිළිබිඹු කරමින් දරු පරපුරට ආදර්ශමත් අදහස් ප්‍රකාශ කරන්නාවූ ගීතයක් ලෙස දැක්විය හැකි පදමාලාවක් ඇතුළත් වන්නේ,

i. අම්මා සඳකි .... ගීතයේය. ii. ආදරයේ උල්පත වූ .... ගීතයේය.

iii. ගමට කලින් හිරු.... ගීතයේය. iv. දෙවැනි බුදුන් .... ගීතයේය.

* * * * * *

# කොටස - II

- **පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්‍යය වේ.**
- **සෙසු ප්‍රශ්න වලින් ප්‍රශ්න දෙකක් තෝරාගෙන සම්පූර්ණ ප්‍රශ්න 03ක් වනසේ පිළිතුරු සපයන්න.**

01. i. ශුද්ධ ස්වර පමණක් යෙදෙන ඖඩව ජාති රාගය නම් කර එහි වර්ජිත ස්වර ලියා දක්වන්න. (ලකුණු 2)

ii. ප,ස̇ වාදී සංවාදී වන නිර්දේශිත රාගයේ ආරෝහණ හා අවරෝහණ ස්වර ලියා දක්වන්න. (ලකුණු 2)

iii. බිලාවල් රාගයේ ජාතිය හා අනුවාදී ස්වර ලියා දක්වන්න. (ලකුණු 2)

iv. ජන ගී ඇසුරින් නිර්මාණය වූ ගීතයක් නම් කර, එහි නිර්මාණකරුවා නම් කරන්න. (ලකුණු 2)

v. නව නාට්‍ය ගීතයක් හා නූර්ති ගීතයක් ඔබ උගත් ගීත ඇසුරින් නම් කරන්න. (ලකුණු 2)

02. i. කාෆි රාගයට අයත් මධ්‍යලය ගීතයක වාදිතයක ස්ථායි කොටස නියමිත තාල සංඥා යොදා ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 03)

ii. භූපාලි රාගයට අදාළව උච්ඡ ස̇ දක්වා විහිදෙන පරිදි ස්වර අභ්‍යාසයක් ආරෝහණ අවරෝහණ වශයෙන් ලියා දක්වන්න. (ලකුණු 03)

iii. බිලාවල් හෝ භූපාලි රාග අතරින් එක් රාගයකට අයත් සර්ගම් ගීතයක් නියමිත තාල සංඥා සමඟ ප්‍රස්තාර කර දක්වන්න. (ලකුණු 04)

03. i. දේශීය පංචතූර්ය භාණ්ඩ වර්ගීකරණය උදාහරණ දෙමින් හඳුන්වන්න. ( ලකුණු 05)

ii. පහත සඳහන් ගීත වර්ග සඳහා අදාල තොරතුරු ඇතුළත් කොට වගුව සම්පූර්ණ කර ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

| ගීත වර්ගය | සංගීත ආභාෂය | යොදාගත් සංගීත භාණ්ඩ | ගීත |
|---|---|---|---|
| හටන් | a | b | නොමදින් විකුම්පාලා |
| වන්නම් | කර්ණාටක | c | d |
| ප්‍රශස්ති | e | උඩැක්කිය | f |

(ලකුණු 03)

iii. ස්වර පුවරු සංගීත භාණ්ඩයක් වන සර්පිනාවේ ව්‍යුහය පිළිබඳව ඔබ උගත් කරුණු හතරක් ලියා දක්වන්න(ලකුණු 02)

04. i. ශ්‍රී ලංකාවේ කණ්ඩායම් සංගීතය ආරම්භ කිරීමට මුලින්ම දායක වූ ගායක කණ්ඩායම් දෙක නම් කර ඒවා පිළිබඳව වෙන් වෙන්ව කරුණු දෙක බැගින් ලියා දක්වන්න. ( ලකුණු 04)

ii. සංගීත ප්‍රසංගයක දී භාවිතා වන තාක්ෂණික මෙවලම් හතරක් නම් කොට ඉන් එකකින් සිදුවන ක්‍රියාකාරීත්වය ලියා දක්වන්න. ( ලකුණු 02)

iii. ජප් තාලය හෝ දීප්චන්දි තාලය නියමිත තාල සංඥා සහිතව ප්‍රස්තාර කර, එම තාල වලට සමාන දේශීය තිත් රූප නම් කරන්න. ( ලකුණු 04)

05. i. පහත දැක්වෙන පාරිභාෂික වචන පිළිබඳව කරුණු දෙක බැගින් ලියන්න.

(a) වාදී ස්වරය. (b) මේල. (c) වර්ජිත ස්වර. (d) රාග. ( ලකුණු 04)

ii. ගිටාරයක තත් සුසර කරන අයුරු දළ රූපසටහනකින් දක්වන්න. ( ලකුණු 03)

iii. පහත සඳහන් ස්වර ප්‍රස්තාර බටහිර ක්‍රමයට අනුව ලිවීමේදී ඒ සඳහා භාවිතා කරන Time Signature දක්වන්න.

| ස්වර ප්‍රස්තාරය | Time Signature |
|---|---|
| a) ස-ස-/ග-සග/ප-ගප/ස̇-ස̇- | |
| b) ගපප ධපප/ ගපප ගරිස | |
| c) ධ̣ ප̣ ධ̣/ ස-රි/ග-ධ/ප-ප | |

( ලකුණු 03)

# වර්ෂ අවසාන වාර පරීක්ෂණය - 2019
# පෙරදිග සංගීතය - පිළිතුරු පත්‍රය
## 9 ශ්‍රේණිය

i පත්‍රය

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 01 - iii | 02 - ii | 03 - iii | 04 - iii | 05. iii | 06 - ii | 07 - iii |
| 08 - iii | 09 - ii | 10 - ii | 11 - ii | 12. ii | 13 - ii | 14 - ii |
| 15 - iv | 16 - ii | 17 - ii | 18 - ii | 19. ii | 20 - i | (ලකුණු 1x20=20) |

ii. පත්‍රය

01. i. භූපාලි - ම නි

ii. සරිගුමපධනිසා/ සානිධපමගරිස (කාෆි)

iii. සම්පූර්ණ - සරිමපනි

iv. දෑතට වළලු - සී ද එස් කුලතිලක ආදී වශයෙන් නම් කර ගීත හා නිර්මාණකරුවා දක්වා තිබිය යුතුය. (ඕනෑම ගීතයක් හෝ ඕනෑම නිර්මාණ කරුවෙක් නම් කළ හැකිය.)

v. විෂය නිර්දේශයට අදාල නව නාට්‍ය ගීතයක් හා නූර්ති ගීතයක් නම්කර තිබීම.

<u>නව නාට්‍ය ගී</u> - ඇඳුරුතුමා වන්න මගේ, හනික වරෙව් කොල්ලනේ, සෝබාවදේ/ කඬේට පලයන් කුමටද සොබනියේ, හෙළගැඹුරුයි පුත නොබලන්.

<u>නූර්ති ගී</u> - වාසනා දිනේකි, අහෝ දුක වාවන්ට බෑ, දුක්කොත් පද්මාවතී, ලියමු මේ සිංහල... ආදී ගීත (ලකුණු 2x5=10)

02. i. කාෆි රාගයට අයත් මධ්‍යලය ගීතයක වාදනයක ස්ථායි කොටස නියමිත තාල සංඥා යොදා නිවැරදිව ස්වර ප්‍රස්තාර කර තිබීම. (ල.3)

ii. භූපාලි රාගයට අදාලව ආරෝහණ අවරෝහණ වශයෙන් ඕනෑම ස්වර අභ්‍යාසයක් ගොඩ නැගීම (ල.3)

iii. භූපාලි හෝ බිලාවල් රාග දෙකෙන් එක් රාගයකට අයත් සර්ගම් ගීතයක් නියමිත තාල සංඥා සහිතව ස්වර ප්‍රස්තාර කර තිබීම. (ල.4)

03. i. ආතත - රබාන විතතාතත - දවුල සුෂිර - හක්ගෙඩිය
විතත - තම්මැට්ටම ඝණ - තාලම්පොට ආදී වශයෙන් ගැළපෙන උදාහරණයක් දී හඳුන්වා තිබිය යුතුය. (ල.5)

ii. අදාල පිළිතුරු යොදා හිස් තැන් සම්පූර්ණ කර පිළිතුරු පත්‍රයේ ලියා තිබීම (ල.3)

iii. i. හතරැස් පෙට්ටියක ස්වරූපය ගනී.
ii. උඩ තට්ටුව හා යට තට්ටුව ලෙස දෙකකට බෙදා ඇත.
iii. සිදුරු විවෘත කිරීම හා වැසීම සඳහා ස්ටෝපර්ස් නමින් හතරැස් ලී පතුරු කැබැල්ලක් ඇත .
iv. පහළ ස්වරයේ සිට ඉහළ ස්වරය දක්වා නළා 36 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් සර්පිනාවේ එසවිය හැකි පහළ මැද ලෑල්ලට සවිකොට ඇත.
v සුළං නිපදවන්නේ බැලෝව මගිනි. ආදි වශයෙනි. (ල.2)

04. i. ලොස් කැබෙලරොස් සහ ලා සිලනියන්ස්

| <u>ලොස් කැබෙලරොස්</u> | <u>ලා සියනියන්ස්</u> |
|---|---|
| නම - ස්පාඤ්ඤ පදයකි | බතික් සරම හා තදපාට අත්කොට කමිසය ඇඳීම |
| සි.ටී ප්‍රනාන්දු, සී.ඩී ෆොන්සේකා ආදි ගායක පිරිස | නායක නොයෙල් බ්‍රයන් රණසිංහ මහතාවේ |
| ගායක - නෙවිල් ප්‍රනාන්දු මහතා වේ | පන්කොළ තොප්පියක් පැළඳීම |
| | හොයියා හෝයියා එක්සත් වී බේදනසා ආදී ගී (ල.4) |

ii. මික්සර්. බෆල්, හෙඩ් ෆෝන්, මයික්‍රෆෝන්, ඇම්ප්ලිෆයර්, කේබල්
එකක ක්‍රියාකාරීත්වය කෙටියෙන් විස්තර කිරීම (ල.2)

iii) ජප් තාලය

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| තාල සංඥා | x | | 2 | | | 0 | | 3 | | |
| මාත්‍රා | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 |
| ඨේකාපදය | ධි | න | ධි | ධි | න | ති | න | ධි | ධි | න |

දීපචන්දි තාලය

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| තාල සංඥා | x | | | 2 | | | | 0 | | | 3 | | | |
| මාත්‍රා | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 |
| ඨේකාපදය | ධා | ධිං | - | ධ | ධ | ධිං | - | ත | තිං | - | ධ | ධ | ධිං | - |

(ලකුණු 04)

05. i. වාදි ස්වරය
- රාගයක ප්‍රධාන ස්වරයයි
- වැඩිපුර යෙදෙන ස්වරයයි

මේල
- රාග උත්පාදනය කිරීම
- ගායනය හෝ වාදනය නොකෙරේ
- ස්වර හතක්ම තිබිය යුතුය

වර්ජිත ස්වර
- රාගයක නොයෙදෙන ස්වර
- වර්ජ්‍ය ස්වර ලෙසද හැඳින්වේ

රාග
- සිත සතුටු කරවන ස්වර සමුදාය වේ
- රාගයක අවම වශයෙන් ස්වර 05ක් තිබිය යුතුය
- ආරෝහණ සහ අවරෝහණ දෙකම තිබිය යුතුය

ආදී වශයෙන් කරුණු දක්වා තිබීම. (ලකුණු 03)

ii. නියමිත පරිදි ගිටාරයේ තත් සූසර කරන ඌයරු දළ රූප සටහනකින් දක්වා තිබිය යුතුය (ලකුණු 04)

iii. a. $4_4$ b. $6_8$ c. $3_4$ (ලකුණු 03)